**මානව සම්පත් අභිවර්ධන ආයතනය - කොළඹ විශ්වවිද්‍යාලය**

**මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලා අංක** 10

**දෙවන සෙමෙස්තර පරීක්ෂණය**

**(පවත්වන ලද්දේ 2022 මාර්තු)**

**(Online Examination)**

## DDAMS 1007 – මත්ද්‍රව්‍ය නීතිය

### උපදෙස්

(01) ඕනෑම **ප්‍රශ්න හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

(02) කාලය පැය දෙකයි (02).

(03) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (**06**) හා පිටු දෙකකින් (02) සමන්විත වේ.

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවලට අංකය කරන්න.

(06) ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නයක් හෝ පිටුවක් මුද්‍රණය වී නොමැති නම් ඒ බව වහාම ශාලාධිපති වෙත දැනුම් දෙන්න.

01. මත්ද්‍රව්‍ය දුර්භාවිත කිරීම පාලනය සහ නිවාරණය උදෙසා ගෝලීය වශයෙන් මෙන්ම කලාපීය වශයෙන් ජාත්‍යන්තර නෛතික රාමුව කෙසේ සකස් වී තිබේද? කරුණු දක්වන්න.

(ලකුණු 25)

02. විෂ වර්ග, අබිං සහ අන්තරාදායක ඖෂධ වර්ග අවභාවිත කිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ කවර නීතියක් ක්‍රියාත්මක වේද? විමර්ශනය කරන්න.

(ලකුණු 25)

03. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ශ්‍රී ලංකාවේ නෛතික රාමුව කෙසේ සකස් වී තිබේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

04. මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරාම් කිරීමට එරෙහිවීම උදෙසා වන ජාත්‍යන්තර නීති ප්‍රතිපාදන ශ්‍රී ලංකාවේ දේශීය නීති පද්ධතියට අදාළ කරගනු ලැබූ අවස්ථාවක් හඳුනාගෙන කරුණු දක්වන්න.

(ලකුණු 25)

05. අධිකරණ නඩු කටයුත්තකදී, සාක්ෂි ලබා දිය හැක්කේ කාටද? අධිකරණ නඩු කටයුත්තක් උදෙසා ඉදිරිපත් කළ හැක්කේ කවර ස්වභාවයකින් යුතු සාක්ෂි ද? අධිකරණ නඩු කටයුත්තකදී සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විමසනු ලබන්නේ කෙසේද? එහි සාක්ෂිකරුවන්ගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය බිඳ හෙලන්නේ කෙසේද? යනාදී කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සාක්ෂි නීතිය තුළ කෙසේ ප්‍රතිපාදන දක්වා තිබේද? සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

06. ජාතික ඖෂධ ප්‍රතිපත්තියකට අනුකූල වන ආකාරයට ඖෂධ, වෛද්‍ය උපකරණ සහ සීමාස්ථ නිෂ්පාදන විෂයෙහි ක්‍රියා කිරීමටත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පිහිටුවීමටත් ප්‍රතිපාදන සලසමින් ශ්‍රී ලංකාවේ නෛතික රාමුවට හඳුන්වා දෙනු ලැබූ නව නීති ප්‍රතිපාදන මොනවාද? අදහස් දක්වන්න.

(ලකුණු 25)

**********